සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

<u>උපදෙස් :</u>

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 පෘථිවිතලයේ සිට කිලෝමීටර් 6 ක් පමණ දක්වා කලාපය තුළ වායුගෝලීය මුළු වායු පරිමාවෙන් ....................................................................... ක් පමණ අන්තර් ගත වේ. (25% / 50% / 75%)

02 උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බැස වායු ගෝලයේ අඩුම උෂ්ණත්වයක් පැවතීම .............................................................. ගෝලයේ විශේෂ ලක්ෂණයකි. (පරිවර්තී / අපරවර්තී / මෙසෝ)

03 ප්‍රාවරණය සහ හරය වෙන් කරන සීමාව ....................................................................... අසන්තතිය නමින් හැඳින්වේ. (ගුටෙන්බර්ග් / ලේමන් / මොහොරොවිසික්)

04 බෝර්නියෝ දූපත පිහිටා ඇත්තේ ....................................................................... මහාද්වීප තටකය තුළය.

(ආසියා / අප්‍රිකා / ඔස්ට්‍රේලියා)

05 වොල්ගා ගංගාව ........................................................... මුහුදට ගලා බසී. (එරල් / කැස්පියන් / මධ්‍යධරණී)

06 ආසියා මහාද්වීපයේ පිහිටි විශාලතම මිරිදිය විල ලෙස ................................................................... විල සලකයි.

(වික්ටෝරියා / බයිකල් / බොල්කෑෂ් )

07 උතුරු අක්ෂාංශ $23\frac{1}{2}^0$ සහ දකුණු අක්ෂාංශ $23\frac{1}{2}^0$ අතර කලාපයේ ....................................................................... දේශගුණ වර්ගය දක්නට ලැබේ. (මධ්‍යධරණී / තුන්ද්‍රා / මෝසම්)

08 ලුණු මිශ්‍ර වැලි පස හා රළිබිම් වඩාත් යෝග්‍ය වන්නේ ................................ වගාවටය. (පොල් / වී / රබර්)

09 ලෝකයේ වානේ නිෂ්පාදනය කරන රටවල් අතුරින් ....................................................................... වැඩිම නිෂ්පාදනයක් සිදු කරමින් ප්‍රමුඛත්වයට පත්ව ඇත. (චීනය / ඇමරිකා එක්සත් ජනපදය / ජපානය)

10 ශ්‍රී ලංකාවේ 1:50000 පරිමාණයට සකස් කළ මුද්‍රිත සිතියම් පත්‍ර සංඛ්‍යාව ...................... වේ. (92 / 89 / 90)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11 හිමාලය කඳු පන්තියේ ඇති ටිබෙට් සානුව මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් පිහිටි සානුවයි. (වැ / නි)

12 ලෝකයේ සෙසු කලාපවලට සාපේක්ෂව අප්‍රිකානු කලාපය තේ නිෂ්පාදනය අතින් ප්‍රමුඛස්ථානය හිමිකරගෙන තිබේ. (වැ / නි)

13 ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ දී ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති (GPS) තාක්ෂණය යොදා ගනී. (වැ / නි)

14 එකම බිමක දීර්ඝ කාලීනව වගා කටයුතු සිදුකිරීම නිසා අස්වැන්න අඩුවීම කෘෂි නිෂ්පාදන ආශ්‍රිත ගැටළුවකි. (වැ / නි)

15 ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාව සඳහා යොදාගනු ලබන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ ය. (වැ / නි)

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක් වේ. 'අ' තීරුවේ අනුපිළිවෙලට 'ආ' තීරුව ගැළපූ විට ලැබෙන පිළිතුරට හිමි අංකය තිත් ඉරමත ලියා දක්වන්න.**

16

| 'අ' ගංගාව | 'ආ' ගලාබසින මුහුද |
|---|---|
| (1) ඩැනියුබ් | A කළු මුහුද |
| (2) නයිල් | B බෝල්ටික් මුහුද |
| (3) මැකන්සි | C මධ්‍යධරණී මුහුද |
| | D බොෆට් මුහුද |

(1) ACD (2) ACB (3) BCA (4) DCB (.........)

17

| 'අ' මහද්වීපය | 'ආ' කඳුවැටිය |
|---|---|
| (1) අප්‍රිකා | A ඇල්ප්ස් |
| (2) යුරෝපා | B අන්දීස් |
| (3) ආසියා | C ඇට්ලස් |
| | D අල්තායි |

(1) ACD (2) CAD (3) BCA (4) DCA (.........)

18

| 'අ' බෝගය | 'ආ' බහුලව ව්‍යාප්ත ප්‍රදේශය |
|---|---|
| (1) තේ | A කුරුණෑගල |
| (2) පොල් | B මහනුවර |
| (3) රබර් | C පොළොන්නරුව |
| | D කෑගල්ල |

(1) BCA (2) ACD (3) DCB (4) BAD (.........)

19

| 'අ' සානුව | 'ආ' පිහිටි මහද්වීපය |
|---|---|
| (1) බියේ | A දකුණු ඇමරිකානු |
| (2) පාමීර් | B අසියා |
| (3) බ්‍රසීලියානු | C අප්‍රිකා |
| | D උතුරු ඇමරිකානු |

(1) BCA (2) CBD (3) CBA (4) CAD (.........)

| 20 | ‘අ’ | ‘ආ’ |
|---|---|---|
| | ධීවර කර්මාන්තය | ව්‍යාප්තව පවතින ප්‍රදේශ ය |
| | (1) මිරිදිය | A ගංමෝය, කලපු හා කිවුල්දිය |
| | (2) කරදිය | B අභ්‍යන්තර ජලාශ, වැව් |
| | (3) කිවුල්දිය | C පොකුණු, වැව් හා කලපු |
| | | D ගැඹුරු මුහුදු ප්‍රදේශ |

(1) CDA (2) BDA (3) BCD (4) BDC (.........)

- **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21 මරියානා සහ මින්ඩනාඕ යන සාගර ආගාධ පිහිටා ඇත්තේ ........................................................ සාගරයේ ය.


22 පෘථිවි කබොල සහ ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ...................................... ලෙස හැඳින් වේ.

23 ශ්‍රී ලංකාවේ කිරිගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානය ................................................ ප්‍රදේශයේ පිහිටුවා ඇත.

24 මිනිසා සතු ශිල්පීය හා තාක්ෂණ දැනුම යොදා ගනිමින් අමුද්‍රව්‍ය හා අනෙකුත් සාධක උපයෝගී කරගෙන නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත .................................................... ලෙස හැඳින්වේ.

25 1 : 50 000 භූ ලක්ෂණ සිතියම්වල විවිධ භූ ලක්ෂණ ................................................................... මගින් පෙන්නුම් කරයි.

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත රූප සටහන උපයෝගී කරගන්න.**




26 රූප සටහනෙහි A - B රේඛාවෙන් දැක්වෙන්නේ .......................................................................... බෑවුමකි.

27 රූප සටහනෙහි C - D රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය වන්නේ ........................................................ යි.

28 රූප සටහනෙහි E - F රේඛාවෙන් දැක්වෙන්නේ ...................................................................... කි.

29 රූප සටහනෙහි G - H රේඛාවෙන් පෙන්වන භූ ලක්ෂණ ................................................................... කි.

30 රූප සටහන අනුව එම ප්‍රදේශයේ පවතිනුයේ ............................................................ ජලවහන රටාවකි.

- ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.

31. - පෘථිවි ස්කන්ධයෙන් 1% පමණ වේ.
    - ඝණකම ඒකාකාරී නොවේ.
    - පාෂාණ වලින් සමන්විතයි.
    - ඛණිජ වර්ග රාශියක් අන්තර්ගතයි.

    ඉහත තොරතුරු වලින් කියැවෙන්නේ පෘථිවි ව්‍යුහයේ කුමන ස්ථරය පිළිබඳව ද?

    (1) ප්‍රාවරණය (2) අභ්‍යන්තර හරය (3) ඉහළ ප්‍රාවරණය (4) කබොල (.........)

32. සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වටවූ මුහුදකට නිදසුනකි,

    (1) මධ්‍යධරණී මුහුද (2) කහ මුහුද (3) එරල් මුහුද (4) රතු මුහුද (.........)

33. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් අපරවර්තී වායුගෝලය හා සම්බන්ධ වන නිවැරදි ප්‍රකාශ දෙක තෝරන්න.

    A - සියලුම කාලගුණික සංසිද්ධීන් ක්‍රියාත්මක වීම.

    B - අභ්‍යවකාශයේ සිට පෘථිවිය දෙසට පතිත වන උල්කාෂ්ම දැවී විනාශ වීම.

    C - උෂ්ණත්වය උන්නතාංශය සමඟ ක්‍රමයෙන් ඉහළ යාම.

    D - විද්‍යුත් ක්‍රියාවලීන් බහුලව සිදු වීම.

    (1) A හා B (2) B හා C (3) A හා C (4) B හා D (.........)

34. වර්ෂාව මගින් පෘථිවිය මතට ලැබෙන ජලයෙන් කොටසක් භූමිය මතුපිට ගලායාම .................... ලෙස හැඳින්වේ.

    (1) අධිධාවිතය (2) කාන්දු වීම (3) අපධාවය (4) පත්‍ර කඩනය (.........)

35. - 3000 mm හා 5000 mm අතර වර්ෂාපතනය.
    - පැල වැඩෙන කාලයේ සිසිල් දේශගුණය.
    - හොඳින් ජලය බැසයන තැනිතලා බිම්.
    - වර්නෝසම් පස

    ඉහත සඳහන් භෞතික සාධක වැදගත් වන්නේ කිනම් වගාවක් සඳහා ද?

    (1) වී (2) බාර්ලි (3) තිරිඟු (4) මිලට් (.........)

36. ශ්‍රී ලංකාවේ මැදරට තේ වගාව සිදු කෙරෙන දිස්ත්‍රික්ක දෙකක් දක්වෙන පිළිතුර තෝරන්න.

    (1) මහනුවර හා බදුල්ල (2) නුවරඑළිය හා බදුල්ල

    (3) මහනුවර හා කෑගල්ල (4) රත්නපුර හා මාතලේ (.........)

37. පහත දැක්වෙන තොරතුරු අතරින් නිවර්තන දේශගුණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

    (1) ඍතු භේදය නිසා උෂ්ණත්වය අඩු වැඩිවේ.

    (2) පැහැදිලි උණුසුම් ඍතුවක් හා වර්ෂණය සහිත ශීත ඍතුවක් පැවතීම.

    (3) වාර්ෂික වර්ෂාපතනය ඉතා පහල මට්ටමක පැවතීම.

    (4) අවුරුද්ද පුරා පැතිරුණු වර්ෂාපතනයක් පැවතීම. (.........)

38. පෘථිවියේ යම් ස්ථානයක නිවැරදි පිහිටීම දැනගැනීම සඳහා සුදුසු වඩාත් කාර්යක්ෂම ක්‍රමය වන්නේ,

    (1) භූගෝලීය තොරතුරු පද්ධතිය (2) භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය

    (3) භූ ලක්ෂණ සිතියම (4) දුරස්ථ සංවේදනය (.........)

- ප්‍රශ්න අංක 39 හා 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.

    A - ආයු අපේක්ෂාව

    B - පොසිල ඉන්ධන දහනය

    C - වියපත් ජන සංඛ්‍යාව

    D - වායු දූෂණය

    E - ළදළ මරණ අනුපාතිකය

39. එක් සාධකයක අඩුවීම වෙනත් සාධකයක් වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ,

    (1) B හා D ය. (2) A හා E ය. (3) C හා D ය. (4) A හා C ය. (.........)

40. එක් සාධනයක වැඩිවීම තවත් සාධකයක ද වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන් ප්‍රකාශ අඩංගු අක්ෂර දෙන ඇතුළත් පිළිතුර වනුයේ,

    (1) B හා D ය. (2) C හා E ය. (3) A හා D ය. (4) C හා D ය. (.........)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**10 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව - II** | **කාලය පැය 02 යි**

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි. I කොටසේ ප්‍රශ්නය අනිවාර්යවේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය. II කොටසින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.**

---

## I - කොටස

(01) (අ) (i) තේමා සිතියමක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 01)

(ii) තේමා සිතියම ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 01)

(iii) ශ්‍රී ලංකාවේ 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක ආකෘතිය ඇඳ එහි ප්‍රධාන තීරු නම් කරන්න. (ලකුණු 02)

(iv) 1 : 50,000 භූ ලක්ෂණ සිතියමේ,

(a) රේඛීය පරිමාණය දක්වන සටහන නිවැරදිව ඇඳ දක්වන්න. (ලකුණු 01)

(b) දිශාව දක්වන සටහන නිවැරදිව ඇඳ දක්වන්න. (ලකුණු 01)

(v) 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක $64\ cm^2$ කින් දැක්වෙන වගා භූමි ප්‍රදේශයක සැබෑ වර්ගඵලය ගණනය කර දක්වන්න. (ලකුණු 01)

(vi) පහත සඳහන් ප්‍රකාශ කියවා නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඔබගේ පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න. (ලකුණු 03)

(a) 1 : 50,000 භූ ලක්ෂණ සිතියම්වල ප්‍රධාන ශීර්ෂ අටක් යටතේ සූචකය සකස් කර ඇත. (......)

(b) භූ ලක්ෂණ සිතියම්වල එක් සිතියම් පත්‍රයකින් භූමියේ ආවරණය වන වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1000 කි. (......)

(c) 1 : 50,000 භූ ලක්ෂණ සිතියම්වල සෑම සිතියම් කොටසකම කිලෝමීටර් 10 න් 10 ට ජාතික ඛණ්ඩාංක ලකුණු කර තිබේ. (......)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) පිරනීස් කඳුවැටිය A B C

(ii) ෆ්ලොරිඩා අර්ධද්වීපය D E F

(iii) වික්ටෝරියා විල GHJ

(iv) ටිමෝර් මුහුද KLM

(v) ටෝකියෝ PQR

(ඉ) ඔබ වෙත සපයා ඇති ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) මුලතිව් දිස්ත්‍රික්කය ABC

(ii) හලාවත DEF


(iii) බතලගොඩ GHJ

(iv) ඉගිනියාගල KLM

(v) තලවකැලේ PQR

## <u>II කොටස</u>

02 පහත දැක්වෙන්නේ වායුගෝලීය සංයුතිය දැක්වෙන රූපසටහනකි.




(i) ඉහත රූප සටහනේ A හා B අක්ෂරවලින් දැක්වෙන ප්‍රධාන වායු වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) D අක්ෂරයෙන් දැක්වෙන වායු වර්ගය නම් කරන්න.

(b) ඔබ ඉහත (a) හි සඳහන් කළ වායු වර්ගයේ සංයුතිය වෙන්වීමට හේතුවන මානුෂ ක්‍රියාකාරකම් 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) (a) වායුගෝලීය සංයුතිය වෙනස් වීමෙන් මිනිසාට අත්විඳීමට සිදුවන ප්‍රතිඵල දෙකක් පැහැදිලි කරන්න.

(b) වායුගෝලය දූෂණය අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03) (i) පෘථිවියේ ජලය ව්‍යාප්තව පවතින ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජලයේ ගුණාත්මක බව අඩුවීමට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) (a) ජෛවගෝලයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම් කරන්න.

(b) ජෛවගෝලයේ සමතුලිතතාව බිඳවැටීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් නම් කර ඉන් එකකින් සිදුවන බලපෑම විස්තර කරන්න. (ලකුණු 05)

04 පෘථිවියේ භූ විෂමතා ලක්ෂණ පරිමාව අනුව එකිනෙකට වෙනස් වේ.

(i) පරිමාව අනුව විශාලතම භූ රූප වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත නිර්වචනවලින් දැක්වෙන භූ රූප නම් කරන්න. (ලකුණු 03)

(a) මහාද්වීප මායිම කෙළවර එකවරම සාගරයට බෑවුම් වන ප්‍රදේශය.

(b) ජලයෙන් වට වූ විවිධ හැඩයෙන් යුත් කුඩා ගොඩබිම් ප්‍රදේශ.

(c) මුදුන් කීපයක් සහිත විවිධ බෑවුම්වලින් හා ඉහළ උන්නතාංශයකින් යුත් එක දිගට විහිදෙන භූ රූප.

(iii) (a) තැනිතලා ප්‍රදේශ ආශ්‍රිතව සිදුකෙරෙන මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(b) ගංගා හා විල් මානුෂ ක්‍රියාකාරකම් වලදී වැදගත්වන ආකාර 02 ක් නිදසුන් දෙකක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) ආසියාවෙන් බැහැරව වී වගා කරන උතුරු ඇමරිකාවේ පිහිටි ගංගා නිම්න දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) (a) කඳුකර ප්‍රදේශවල වී වගා කරන ආකාරය ලියන්න.

(b) ලෝකයේ වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) වර්තමාන ශ්‍රී ලංකාවේ වී වගාකරන ගොවීන් මුහුණදෙන ගැටළු දෙකක් පැහැදිලි කරන්න.

(b) ශ්‍රී ලංකාවේ වී වගාව දියුණු කිරීම සඳහා රජය අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) ලෝකයේ ස්වභාවික රබර් නිපදවනු ලබන,

(a) දකුණු ආසියාතික රටක් හා

(b) අග්නිදිග ආසියාතික රටක් පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)

(ii) රබර් වගාව ව්‍යාප්තවීමට බලපාන පහත දැක්වෙන භෞතික සාධක සඳහන් කරන්න. (ලකුණු 03)

(a) වර්ෂාපතනය

(b) පස

(c) උෂ්ණත්වය

(iii) (a) ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරන යුරෝපා සංගමයේ රටවල් දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ රබර් වගාව ආශ්‍රිතව පැන නැඟී ඇති ගැටළු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) ව්‍යාපාරික කිරිපට්ටි පාලනය සිදුකරන ලෝකයේ ප්‍රධාන රටවල් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඔබ ඉහත (i) නම් කරන ලද රටවල කිරිපට්ටි පාලනය දියුණුවීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීම සඳහා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා ඇති ප්‍රදේශ දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකා රජය මෑත කාලයේදී සත්ව පාලනය කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු වූ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)


(08) (i) ශ්‍රී ලංකාවේ වගා කරන සාම්ප්‍රදායික නොවන සුළු අපනයන භෝග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) (a) ශ්‍රී ලංකාවේ සුළු අපනයන පර්යේෂණ ආයතන පිහිටි ප්‍රදේශ නම් කරන්න.

(b) සුළු අපනයන භෝග වගාව දියුණු කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ එළවළු වගාව සම්බන්ධයෙන් හඳුනාගත හැකි විශේෂිත කලාප 02 ක් ලියන්න.


(b) ශ්‍රී ලංකාවේ එළවළු හා පළතුරු වගාවේ දී තාක්ෂණ යොදා ගන්නා ආකාර දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)




(i)
(ii)
(iii)
(iv)
(v)

/5

01 (ඉ) / (C)




(i)
(ii)
(iii)
(iv)
(v)

/5

01 (අ)(A) /10 + (ආ)(B) /5 + (ඉ)(C) /5 = /20

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

ශ්‍රේණිය/Grade : ......................

විභාග අංකය
சுட்டெண்
Index Number ......................................................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) (අ) (A)

(i) ..................................................................................................

..................................................................................................

(ii) ..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

(iii)

(iv) (a)

(b)

(v) ..................................................................................................

(vi) (a) ..................................................................................................

(b) ..................................................................................................

(c) ..................................................................................................

10

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** — **දෙවන වාර පරීක්ෂණය 2025**

**10 ශ්‍රේණිය** — **භූගෝල විද්‍යාව**

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 50% | 11 | නි | 21 | පැසිපික් | 31 | 4 |
| 02 | මෙසෝ | 12 | වැ | 22 | ශිලාගෝලය | 32 | 3 |
| 03 | ගුටෙන්බර්ග් | 13 | නි | 23 | මීවනපලාන | 33 | 2 |
| 04 | ආසියා | 14 | වැ | 24 | නිෂ්පාදන කර්මාන්ත | 34 | 3 |
| 05 | කැෂ්පියන් | 15 | වැ | 25 | සමෝච්ච රේඛා | 35 | 3 |
| 06 | බයිකල් | 16 | 1 | 26 | උත්තල | 36 | 1 |
| 07 | මෝසම් | 17 | 2 | 27 | කපොල්ල | 37 | 4 |
| 08 | පොල් | 18 | 4 | 28 | කොත්කන්ද | 38 | 2 |
| 09 | චීනය | 19 | 3 | 29 | ආයතගාමී නිම්නය | 39 | 2 |
| 10 | 89 | 20 | 2 | 30 | ජලාකාර | 40 | 1 |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)


## II පත්‍රය

### I - කොටස

(01) (අ) (i) එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කළ සිතියම්. (ල. 01)

(ii)
- එක් තේමාවක් පිළිබඳ දැක්වෙන සුවිශේෂත්වය.
- නිරූපිත තොරතුරු සංකීර්ණ නොවන බැවින් පහසුවෙන් වටහා ගත හැකි වීම.
- විවිධ තේමා සිතියම් එකිනෙක හා සංසන්දනය කිරීමේ හැකියාව.
- එකම තේමාවක් දැක්වෙන සිතියම් කීපයක් මගින් කාලීන වෙනස්වීම් දැන්වීම හැකිවීම වැනි ප්‍රයෝජනවලින් දෙකක් ලිවිය යුතුයි. (ල. 01)

(iii)





නිවැරදි ආකෘතිය ඇඳීමට ලකුණු 01 යි.
නිවැරදිව තිර නම් කිරීමට ලකුණු 01 යි.

(iv) (a)




10cm දහයක් ගෙන එය 2cm න් ට වෙන්කර පළමු කොටස 2mm ට 2mm ට වෙන කර නිවැරදිව ඇඳ තිබීමට ලකුණු 01 යි.

(b)




නිවැරදිව ඇඳ නම් කිරීමට ලකුණු 01 යි.

(v)

$64\ cm^2$

$\frac{8cm}{2} \times \frac{8cm}{2}$

4 km x 4 km

$16\ km^2$

නිවැරදි වර්ගඵලය සඳහන්කර ඇත්නම් ලකුණු 01 යි.

(vi) (a) ✓ (b) ✓ (c) ×

(ආ) (i) A (ii) F (iii) H (iv) K (v) Q

(ඉ) (i) A (ii) D (iii) G (iv) L (v) Q

### II කොටස

(02) (i) A - නයිට්‍රජන් B - ඔක්සිජන් (ල. 02)

(ii) (a) කාබන් ඩයොක්සයිඩ් (ල. 01)

(b)
- වනාන්තර විනාශ කිරීම.
- ඉන්ධන දහනය
- කර්මාන්තශාලාවලින් දුම්පිට කිරීම.
- වනාන්තර ගිනි තැබීම.
- කෘෂිකාර්මික කටයුතුවලදී රසායන ද්‍රව්‍ය භාවිතය වැනි නිවැරදි කරුණු 02 ක් කෙටියෙන් පැහැදිලි කිරීමට (ල.02)

(ii) (a)
- කාලගුණික වෙනස්කම් ඇතිවීම.
  - ★ වර්ෂාපතන රටාව වෙනස්වීම. ★ සුළං රටාව වෙනස්වීම.
- ගෝලීය උෂ්ණත්වය ඉහළයාම (සාගර ජල මට්ටම ඉහළයාම)
- ඕසෝන් වියනට හානි සිදුවීම.
- අම්ල වැසි ඇතිවීම වැනි ප්‍රතිඵල දෙකක් පැහැදිලි කිරීමට (ල.02)

(b)
- නැවත වන වගාව / වනාන්තර ආරක්ෂා කිරීම
- ඉන්ධන දහනය නොමැති ඉලෙක්ට්‍රොනික (Hybrid) වාහන හඳුන්වා දීම.
- පරිසර හිතකාමී වායු වර්ග භාවිතය (ශීතකරණ හා වායු සමීකරණ සඳහා)
- වාහනවල දුම් පරීක්ෂාව
- පෞද්ගලික ප්‍රවාහන වෙනුවට පොදු ප්‍රවාහන සේවා දියුණු කිරීම වැනි නිවැරදි කරුණු 03 ක් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 03 යි)

(03) (i)
- මතුපිට ජලය (ගංගා, සාගර, මුහුදු, ඇළ, දොළ, විල්)
- භූගත ජලය (පෘථිවි අභ්‍යන්තරයේ ඇති ජලය)
- ජල වාෂ්ප (වායුගෝලයේ ඇති ජලය) මෙයින් ආකාර දෙකක් දැක්වීමට ලකුණු 02 යි.

(ii)
- නාගරික හා කාර්මික අපද්‍රව්‍ය ජලයට මුදා හැරීම.
- ජලයේ සිදු කෙරෙන විවිධ න්‍යෂ්ටික අත්හදාබැලීම්.
- ජලයට තෙල් කාන්දුවීම.
- මැණික් ගැරීම, වැනි ජලය දූෂණය වන ක්‍රියාකාරකම් 02 ක් පැහැදිලි කිරීමට ලකුණු 03 යි

(iii) (a) ජීවී සාධක සහ අජීවී සාධක (ල.02)

(b)
- වනාන්තර විනාශ කිරීම.
- වන සතුන් දඩයම් කිරීම.
- අනවසර ඉදිකිරීම්
- අනවසර ඉඩම් ගොඩකිරීම්
- නොගැලපෙන කෘෂිකාර්මික කටයුතු
- ඉන්ධන දහනය කිරීම
- සත්ව වාස භූමි විනාශ කිරීම වැනි ක්‍රියාකාරකම් දෙකක් ලියා ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 03.

(04) (i) පළමු සනයේභූ රූප - මහාද්වීප හා සාගර (ල. 02)

(ii) (a) මහාද්වීපික බෑවුම

(b) දූපත

(c) කඳු වැටි (ල. 03)

(iii) (a)
- සත්ව පාලනය සිදුකිරීම.
- ජනාවාසකරණය සඳහා යොදා ගැනීම.
- කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම.
- අධිවේගී මාර්ග ඉදිකිරීම වැනි නිවැරදි ක්‍රියාකාරකම් දෙකක් ලිවීමට ලකුණු 02 යි.

(b)
- භාණ්ඩ ප්‍රවාහනයේ දී (පංච මහා විල්, යුරෝපයේ ගංගා)
- මගී ප්‍රවාහනයේ දී (යුරෝපයේ ගංගා)
- ජල විදුලි බලය නිෂ්පාදනයට (ලංකාවේ ගංගා)
- සංචාරක කටයුතු වලදී
- ධීවර කටයුතුවලදී වැනි නිවැරදි කරුණු ලියා නිදසුන් සපයා ඇත්නම් ලකුණු 03යි.

(05) (i) මිසිසිපි ගංගා නිම්නය, සැනුමැන්ටෝ ගංගා නිම්නය (ල.02)

(ii) (a) හෙල්මළු ක්‍රමයට (ල.01)

(b)
- කුඩා ගොවිබිම්වල වගා කිරීම.
- ඇතැම් රටවල් වාණිජ පදනමකින් වගා කිරීම.
- ශ්‍රම සූක්ෂම වගාවන් වීම.
- ඇතැම් රටවල් යන්ත්‍රසූත්‍ර භාවිතා කිරීම.
- වර්තමානයේ ඓන්ද්‍රිය පොහොර භාවිතයට යොමු වීම.
- ජාන තාක්ෂණය උපයෝගී කර ගැනීම.
- විශේෂ ගුණාංග වලින් යුත් සහල් නිපදවීම.

(වැනි විශේෂ ලක්ෂණ දෙකක් ලියා ඇත්නම් ලකුණු 02 යි.)

(iii) (a)
- ඉඩම් ගොඩකිරීම හා ඉඩම් කැබලි වී යාම.
- එකම බිමක දීර්ඝකාලීනව වගා කිරීම නිසා අස්වැන්න අඩු වීම.
- බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න අඩුවීම.
- පොහොර මිල ඉහළයාම.
- යෙදවුම් වල මිල ඉහළ යාම.
- ස්වභාවික ආපදා ඇතිවීම.
- සෞඛ්‍යමය ගැටළු ඇතිවීම. (වැනි ගැටළු දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(b)
- ජාන තාක්ෂණය මගින් වැඩි ඵලදායී බීජ වර්ග හඳුන්වා දී තිබීම.
- නවීන යන්ත්‍රසූත්‍ර හඳුන්වාදීම.
- වී වලට සහතික මිල ක්‍රමයක් ඇතිකිරීම.
- පොහොර සඳහා මුදල් ලබාදීම (පොහොර සහනාධාරය)
- ඓන්ද්‍රීය පොහොර භාවිතය ප්‍රචලිත කිරීම.
- ගොවි විශ්‍රාම වැටුප් රක්ෂණ ක්‍රම හඳුන්වා දීම.
- වගා හානි වලට වන්දි ගෙවීම (වැනි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 03 යි.)

(06) (i) (a) දකුණු ආසියාව - ඉන්දියාව, ශ්‍රී ලංකාව

(b) අග්නිදිග ආසියාව - තායිලන්තය, ඉන්දුනීසියාව, මැලේසියාව, වියට්නාමය (ල.02)

(ii) (a) 2000 mm පමණ වැඩි වර්ෂාපතනය

(b) ලැටරයිට් හෝ කබොක් මිශ්‍ර රතු පස

(c) $27^0C$ පමණ සාමාන්‍ය උෂ්ණත්වය (ල.03)

(iii) (a) ඔස්ට්‍රියාව, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනියා, ග්‍රීසිය, ඉතාලිය යන රටවලින් 02 ක් නම් කිරීමට (ල.02)

(b)
- ඉඩම් කැබලි වී යාම.
- රබර් ගස් වල අස්වැන්න අඩුවීම.
- කර්මාන්තශාලා නවීකරණය නොවීම.
- ආදේශන භාණ්ඩවලින් එල්ලවන තරගය.
- ලෝක වෙළඳපලේ මිල උච්චාවචනය වීම.
- වෙනත් රටවලින් එල්ල වන තරඟය (වැනි ගැටළු දෙකක් කෙටියෙන් පැහැදිලි කිරීමට) (ල.03)

(07) (i) ඉන්දියාව, බ්‍රසීලය, චීනය, ඔස්ට්‍රේලියාව, නවසීලන්තය, රුසියාව, මෙක්සිකෝව, පාකිස්ථානය, ආජන්ටිනාව, ඩෙන්මාර්කය, ඇමරිකා එක්සත් ජනපදය වැනි රටවලින් දෙකක් ලිවීමට (ල.02)

(ii)
- තණබිම් වල ව්‍යාප්තිය
- ජල පහසුව
- පුහුණු ශ්‍රමය
- නව තාක්ෂණය
- වෙළඳපල යන සාධක 02 ක් ලියා පැහැදිලි කිරීමට (ල.02)

(iii) (a) අඹේවෙල, කනන්විල, වල්පිට මින් දෙකක් ලිවීමට (ල.02)

(b)
- ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.
- ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට රැකියා ලබාදීම.

- වගා කටයුතු සඳහා යොදා ගත නොහැකි ආන්තික බිම් වලින් ප්‍රයෝජන ලබා ගැනීම.
- ගොවි ජනතාවට අතිරේක ආදායම් මාර්ගයක් සලසා දීම.
- විදේශ විනිමය ඉපයීම. (වැනි කරුණු දෙකක් විස්තර කිරීමට ල.03)

(08) (i) බුලත්, මල්, පළතුරු, මිරිස්, රටකජු, විසිතුරු පැළ, එළවළු වැනි බෝග දෙකක් ලිවීමට (ල.02)

(ii) (a) මාතලේ (ල.01)

(b)
- විදේශ විනිමය ලැබීම.
- දේශීය ජනතාවගේ ආදායම වැඩිවීම.
- අමතර ආදායම් මාර්ගයක් වීම.
- රැකියා උත්පාදනය වීම (වැනි ප්‍රයෝජන දෙකක් පැහැදිලි කිරීමට) (ල.02)

(iii) (a)
- වියළි කලාපය
- තෙත් කලාපය
- කඳුකර කලාපය (මෙයින් දෙකක් ලිවීමට) (ල.02)

(b)
- බිම් සකස් කිරීම සඳහා අත් ට්‍රැක්ටර් භාවිතා කිරීම.
- අස්වනු නෙලීම සඳහා.
- අස්වනු වෙළඳපලවෙත ප්‍රවාහනය කිරීමේදී ශීතකරණ භාවිතා කිරීම.
- ආහාර පැකට් කිරීම, කල්තබා ගැනීමේ ක්‍රම අනුගමනය කිරීම.
- නැවුම් පළතුරු ලෙස මෙන්ම කැබලි හා විජලනය කිරීම.
- දඹුල්ලේ ඉදිකර ඇති කෘෂි විජලන මධ්‍යස්ථානය මගින් එළවළු හා පළතුරු ආරක්ෂා කිරීම. (වැනි නව තාක්ෂණය යොදා ගන්නා ආකාර දෙකක් පැහැදිලි කිරීමට) (ල.03)